සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

17690

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 යි

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

## I පත්‍රය

විශේෂ උපදෙස් :
- ★ සියළුම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. ඊට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- ★ II, III හා IV කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතු ය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

## I කොටස

- 1 සිට 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට අයත් අංකය තෝරා ලියන්න.

01. වෘත්තීන් ආශ්‍රිත ගැමි නැටුමක් නොවන්නේ ........................................ ය.
   1. ගොයම් නැටුම
   2. පන් නෙළීමේ නැටුම
   3. පතුරු නැටුම
   4. කුළු නැටුම (.......)

02. ඉල්ලම් ගැරීම, සකපෝරුව භාවිතා කිරීම, ගස් කප්පාදු කිරීම යන කාර්යයන් ඉදිරිපත් කිරීම පිළිවෙලින් ........................................ කර්මාන්ත තුළ දැකිය හැකි ය.
   1. පතල්, තේ, කොහු
   2. කොහු, පතල්, මැටි
   3. මැටි, පතල්, කෘෂි
   4. පතල්, මැටි, තේ (.......)

03. උඩරට, සබරගමු, පහතරට නර්තන සම්ප්‍රදායන් තුළ පාද හා දැත් හුරුකර ගැනීමේ සරඹ හඳුන්වන නම් පිළිවෙලින් ........................................ වේ.
   1. ඉලංගම් සරඹ, ගොඩ සරඹ, දොඹින පද
   2. ගොඩ සරඹ, දොඹින පද, ඉලංගම් සරඹ
   3. දොඹින පද, ගොඩ සරඹ, ඉලංගම් සරඹ
   4. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද (.......)

04. සරඹ නර්තනයේදී විලම්භ, මධ්‍ය, දෘත සඳහා භාවිතා කළ හැකි තවත් නාම පිළිවෙලින් දැක්වූ විට,
   1. සම ගුණ, දෙ ගුණ, සිව් ගුණ
   2. දෙ ගුණ, සම ගුණ, සිව් ගුණ
   3. සිව් ගුණ, දෙ ගුණ, සම ගුණ
   4. සම ගුණ, සිව් ගුණ, දෙ ගුණ (.......)

05. පුද්ගලයෙකුගේ මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන ප්‍රධාන කරුණු දෙක වන්නේ .................... වේ.
   1. පාරිසරික සාධක, මනා පෞරුෂය
   2. චිත්තවේග පාලනය, නිවැරදි චර්යාවන්
   3. මනා පෞරුෂය, චිත්තවේග පාලනය
   4. පාරිසරික සාධක, ජානමය සාධක (.......)

06. ආසාතාත්මක සහ අනාසාතාත්මක ලක්ෂණ ද්විත්වයම එකම ගායනය තුළ දැකිය හැකි කවි විශේෂය වන්නේ,
   1. ප්‍රශස්ති
   2. නමස්කාර ගාථා
   3. ටීකා සීපද
   4. සිරසපාද කවි (.......)

07. "විශ්ම" නමැති ස්ථායී භාවය තුළින් ...................... රසය උපදී.

1. අද්භූත
2. රෞද්‍ර
3. බීභත්සය
4. ශෘංගාර (.......)

08. හේවිසි වාදනයේදී භාවිතා කරනු ලබන විතත අවනද්ධ භාණ්ඩය කුමක් ද?

1. දවුල
2. තම්මැට්ටම
3. ගැට බෙරය
4. හොරණෑව (.......)

09. මහනුවර යුගයේ කළගෙඩි සෙල්ලමේ යෙදෙන කාන්තාවන් පිළිබඳව තොරතුරු දක්වා ඇත්තේ,

1. ඉබන් බතූතා
2. ස්පිල් බර්ජන්
3. රොබට් නොක්ස්
4. ක්වේරොස් (.......)

10. මාත්‍රා 2+2+3 තාල රූපය හඳුන්වන්නේ ...................... ලෙස ය.

1. දෙසුළු මහ තුන් තිත
2. සුළු සුළු මැදුම් තුන් තිත
3. දෙසුළු මැදුම් තුන් තිත
4. සුළු දෙමැදුම් තුන් තිත (.......)

11. රාධා ක්‍රිෂ්ණා ප්‍රේම වෘත්තාන්තය ...................... නර්තන සම්ප්‍රදායට පදනම් වී ඇත.

1. මණිපුරි 2. කථක් 3. භරත 4. කථකලි (.......)

12. කෝලම් නාටකයේ පූර්ව රංගයේ දී සහාගතවන කෝලම් ...................... ලෙස හැඳින් වේ.

1. අතිමානුෂ චරිත
2. මනඃකල්පිත චරිත
3. සත්ව කෝලම්
4. පණිවිඩ කෝලම් (.......)

13. සොකරි නාටකයේ පාත්‍ර වර්ගයා සඳහන් පිළිතුර වන්නේ,

1. සොකරිය, හෙංචා, ගුරුහාමි
2. ගුරුහාමි, පරයා, සොත්තානා
3. සොත්තානා, සොකරි, ජසයා
4. පරයා, ලෙන්චිනා, ගුරුහාමි (.......)


14. කථකලි නර්තනයේ භාවිත එඩැක්ක නම් වාද්‍ය භාණ්ඩය හා දේශීය වාද්‍ය භාණ්ඩ අතර ඇති .............................. හැඩය අතින් සමාන ය.

1. උඩැක්කිය
2. ගැට බෙරය
3. බුම්මැඩිය
4. පොකුරු බෙරය (.......)

15. "විජයතුමා තම්මැන්නේ" ගීතයේ පද රචනය කර ඇත්තේ .............................. වේ.

1. සුදත් සමරසිංහ මහතා
2. ටිබෙට් ජාතික එස්.මහින්ද හිමි
3. එඩ්වඩ් ජයකොඩි මහතා
4. ජෝන් ද සිල්වා මහතා (.......)

16 - 20 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් රූප ඇසුරින් පිළිතුරු සපයන්න.



A B C D

16. A සහ B රූපවලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් ............................ වේ.

1. කථක් සහ කථකලි
2. භරත සහ මණිපුරි
3. භරත සහ කථක්
4. මණිපුරි සහ කථක් (.......)

17. C සහ D රූපවලින් දැක්වෙන්නේ ............................ ඇඳුම් කට්ටල වේ.

1. වෙස් සහ තෙල්මේ
2. දෙවොල් සහ පබළු
3. පබළු සහ වෙස්
4. දෙවොල් සහ තෙල්මේ (.......)

18. A රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ............................ වේ.
1. මෘදංගය
2. තබ්ලාව
3. පුංග් බෙරය
4. සාරංගිය
(.......)

19. C රූපයෙන් දැක්වෙන ඇඳුම් කට්ටලයේ හිසට පැළඳ ඇති ආභරණය ............................ නම් වේ.
1. නෙත්තිමාලය
2. කාඟුල
3. උරමාලය
4. ශිඛාබන්ධනය
(.......)

20. C සහ D රූපවලින් දැක්වෙන නර්තන අංග ඇතුළත් ශාන්තිකර්ම දෙක සඳහන් පිළිතුර වන්නේ,
1. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව
2. දෙවොල් මඩුව, බලි යාගය
3. දෙවොල් මඩුව, පහන් මඩුව
4. පහන් මඩුව, කොහොඹා කංකාරිය
(.......)

21. භාතිකාභය රජු විසින් බෝධි ස්නාන පූජාවක් මහා බෝධියට කළ බව ............................ සඳහන් වේ.
1. දීප වංශයේ
2. චූල වංශයේ
3. ධාතු වංශයේ
4. මහා වංශයේ
(.......)

22. "රටයකුම හෙවත් රිද්දි යාගය" සහ "භාරතීය සම්භාව්‍ය නර්තන කලාව" ග්‍රන්ථ රචනා කළ කතුවරුන්ගේ නම් පිළිවෙලි-න් සඳහන් පිළිතුර වන්නේ,
1. තිස්ස කාරියවසම් මහතා සහ ජයසේන කොට්ටගොඩ මහතා
2. ජයසේන කෝට්ටගොඩ මහතා සහ මුදියන්සේ දිසානායක මහතා
3. මුදියන්සේ දිසානායක මහතා සහ තිස්ස කාරියවසම් මහතා
4. ජයසේන කෝට්ටගොඩ මහතා සහ ඩබ්. බී. මකුලොලුව මහතා
(.......)

23. කරදිය මුද්‍රා නාට්‍යයේ "මණ්නඩි රාළ සහ චන්ද"යන චරිත නිරූපණය කරන් ලද්දේ,
1. සේන වලවේ සහ කේ. එන්. එස්. අටුගොඩ විසින් ය.
2. චිත්‍රසේන ඩයස් සහ සේන වලවේ විසින් ය.
3. චිත්‍රසේන ඩයස් සහ කේ. එන්. එස්. අටුගොඩ විසින් ය.
4. හෙන්රි ජයසේන සහ මහේෂ් උමගිලිය විසින් ය.
(.......)

24. ආහාර්ය අභිනය ............................ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි.
1. අංග රචනය හා රංග රචනය
2. වෙස්මෝස්තර රචනය හා රංග රචනය
3. අංග රචනය හා වෙස්මෝස්තර රචනය
4. වේෂ නිරූපණය හා අභිරූපණය
(.......)

25. "තණ්හා ආශා" ඉගිනළුව නිර්මාණය කරන ලද්දේ ............................ විසින් ය.
1. මිරන්ඩා හේමලතා මහත්මිය
2. ප්‍රේමකුමාර එපිටවෙල මහතා
3. ශේෂා පලිහක්කාර මහතා
4. වජිරා චිත්‍රසේන මහත්මිය
(.......)

26 - 30 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | තත්යානා මකරෝවා | කමත | විදුර නාට්‍යය | වෙස් අත්ත |
| B | තාඩි | සෝමබන්දු විද්‍යාපති | ඩෙප්පු | තානායම්පොළ |
| C | දිව්‍යා මංගලිකා | රන්දද | පුෂ්ප ශෘංගාරය | උදාව |
| D | අංජලිකා මෙල්වානි | බෙර හඬ | මිනික්කු | නරිබෑනා |

26. කුඹි කතාව මුද්‍රා නාට්‍යය සඳහා පාදක වූ "වීර කුඹියා" ග්‍රන්ථයේ කතුවරිය සඳහන් පිළිතුර වන්නේ.
1. D පේළියේ 1 තීරුව
2. B පේළියේ 2 තීරුව
3. C පේළියේ 1 තීරුව
4. A පේළියේ 1 තීරුව
(.......)

27. ඒ. ඉලුල්ගොඩ මහතා විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍ය සඳහන් වන්නේ,
1. C පේළියේ 1 සහ 2 තීරු
2. C පේළියේ 2 සහ 4 තීරු
3. C පේළියේ 1 සහ 4 තීරු
4. C පේළියේ 2 සහ 3 තීරු
(.......)

28. "හනික වරෙව් කොල්ලනේ" නාට්‍ය ගීතය ඇතුළත් නාට්‍යය දක්වා ඇත්තේ,
1. A පේළියේ 3 තීරුව
2. C පේළියේ 2 තීරුව
3. D පේළියේ 2 තීරුව
4. D පේළියේ 4 තීරුව
(......)

29. කථකලි නර්තනයේ රැවුල් භාවිතයෙන් කරනු ලබන වේෂ නිරූපණ ක්‍රමය සඳහන් වන්නේ,
1. B පේළියේ 1 තීරුව
2. B පේළියේ 3 තීරුව
3. D පේළියේ 3 තීරුව
4. C පේළියේ 4 තීරුව
(......)

30. කෝලම් නාටකයේ රඟමඩල හඳුන්වන නම ඇතුළත් වන්නේ,
1. A පේළියේ 2 තීරුව
2. B පේළියේ 3 තීරුව
3. A පේළියේ 4 තීරුව
4. B පේළියේ 4 තීරුව
(......)

## II උඩරට නර්තනය

31. වෙස් නර්තන ශිල්පියා විසින් අඳිනු ලබන සුදු රෙද්ද හඳුන්වන්නේ .............................. නමින් ය.
1. සේලය
2. උල්උඩය
3. පොත්පොට
4. නරු
(......)

32. වෙස් ඇඳුම් කට්ටලයට අයත් ආභරණ ඇතුළත් පිළිතුර වන්නේ.
1. ශිඛාබන්ධනය, තෝඩුපත්, කඩුක්කන්
2. ජටාව, උරබාහු, තළල් පටිය
3. අවුල්හැරය, කෙමෙත්ත, පායින්පත
4. ශිඛාබන්ධනය, කඩුක්කන්, ජටාව
(......)

33. සැවුලා වන්නමේ සහ තුරඟා වන්නමේ තාල රූප පිළිවෙලින් ගත්විට .............................. වේ.
1. මාත්‍රා 2+4 දෙතිත හා මාත්‍රා 2+3 දෙතිත
2. මාත්‍රා 3 තනි තිත හා මාත්‍රා 2+4 දෙතිත
3. මාත්‍රා 2+3 දෙතිත හා මාත්‍රා 2+4 දෙතිත
4. මාත්‍රා 4 තනි තිත හා මාත්‍රා 3 තනි තිත
(......)

34. "කොහොඹා යක් කංකාරිය සහ සමාජය" ග්‍රන්ථයේ කතුවරයා,
1. ජයසේන කෝට්ටගොඩ මහතා වේ.
2. තිස්ස කාරියවසම් මහතා වේ.
3. කේ. එස්. ප්‍රනාන්දු මහතා වේ.
4. මුදියන්සේ දිසානායක මහතා වේ.
(......)

35. මෙම අඩව් කොටස සම්පූර්ණ කිරීමට අදාල වචන ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
ගත්ත ......... තකට ......... තත්කඩ ......... කඩතක ......... තකුඳ
1. ජිත්ත, තකුඳ, තකට, තා
2. තෙහිගු, තකුඳ, ජිත්කඩ, තකට
3. තෙහිගු, ගතකුඳ, දොංකඩ, තකට
4. කුඳක, කුංත, ජිත්කඩ, තෙහිංත
(......)

36. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දුනුමාලප්පුව නර්තනයේදී භාවිතා කරනු ලබන රංග භාණ්ඩය,
1. ඊගස
2. දුන්න සහ ඊතලය
3. කෝලායුධය
4. පොල් පන්දම
(......)

37. .............................. බෙර පදය මාත්‍රා 3+4 දෙතිතේ තාල රූපයට ගැට බෙරයෙන් වාදනය කරයි.
1. දෝං ජිං ජිං තකට දොංතක
2. දොං ජිංත ගත දොංත
3. දො දොංත තකු දොං
4. දොං දොං ජිං ජිං ගජිගත
(......)

38. .............................. විසින් උඩරට වන්නම් රචනා කළ බව සඳහන් වේ.
1. හරණ ගණිතයා
2. කිරිඇල්ලේ ඥානවිමල හිමි
3. රම්මොලවක අධිකාරම්
4. දස්කොන් ඇමති
(......)

39. ගොයම් කැපීමේ නර්තනය වේදිකාවට සරිලන අන්දමින් නිර්මාණය කරන ලද්දේ ..............................
1. වජිරා චිත්‍රසේන මහත්මිය ය.
2. අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා ය.
3. මිරන්ඩා හේමලතා මහත්මිය ය.
4. එස්. පණිභාරත මහතා ය.
(......)

40. "කුඳංත ගත දොං" වට්ටම නර්තනය කරනුයේ .............................. තාල රූපයට අනුව ය.
1. දෙසුළු මැදුම් තුන් තිත
2. දෙමැදුම් මහ තුන් තිත
3. සුළු මැදුම් මහ තුන් තිත
4. දෙසුළු මහ තුන් තිත
(......)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න